## ඇමරිකන් එක්සත් ජනපද  තානාපති කාර්යාලය

කොළඹ

# ප්‍රවෘත්ති නිවේදනය

මහජන කටයුතු අංශය


දුරකථනය+  :94 )1 (249-8100 ෆැක්ස්+ :94 )1 (244-9070

විද්යුත් තැපැල :VanHornNT@state.gov http://lk.usembassy.gov


නිවේදන අංක 20181308

### ශ්‍රී ලංකාවට නැවතත් එක්සත් ජනපද ස්වේච්ඡා සාම ප්‍රජාව (Peace Corps) පැමිණීම සතිටුහන් කරමින් සාම ප්‍රජා සාමාජිකයින් සහ අධ්‍යාපන අමාත්‍යංශය එකගතා ගිවිසුමකට එළඹේ

**කොළඹ අගෝස්තු 13**: ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි අධ්‍යාපනය නගා සිටුවීම සඳහා  එක්සත් ජනපද සාම ප්‍රජා ස්වේච්ඡා සේවකයින්ගේ සහාය විධිමත් ආකාරයෙන් නැවතත්  ලංකාවට ලබාගැනීමට සඳහාවූ අවබෝධතා ගිවිසුමකට 2018 අගෝස්තු 9 දින අධ්‍යාපන අමාත්‍යංශයේ ලේකම් සුනිල් හෙට්ටිආරච්චි මහතා සහ ශ්‍රී ලංකාවේ පීස් කෝප්ස් නේවාසික නියෝජිත ක්‍රිස් බෙච් මහතා අත්සන් තබනු ලැබීය. 1962 සිට 1998 දක්වා ස්වේච්ඡා සාම ප්‍රජාවේ සාමාජිකයින් ශ්‍රී ලංකාවට පැමිණියහ. එසේම සාම ප්‍රජාවේ සාමාජිකයන් 2004 දී ශ්‍රී ලංකාව මුහුණ දුන් සුනාමි ව්‍යසනයෙන් පසු නැවත යථා තත්වයට පත්වීමේ ප්‍රයත්යන්ටද සහාය දැක්විය.

ශ්‍රී ලංකාව සහ මාලදිවයින සඳහා වැඩ බලන එක්සත් ඡනපද තානාපති  රොබර්ට් හිල්ටන් සහ ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අමාත්‍ය අකිල විරාජ් කාරියවසම් මහතා අධ්‍යාපන අමාත්‍යංශයේදී සාක්ෂියට අත්සන් තැබීය.  රොබර්ට් හිල්ටන් මහතා ඔහුගේ අදහස් දැක්වීමේදී 1961 දී ජනාධිපති ජෝන් එෆ් කෙනඩි විසින් සාම බලකාය පිහිටුවීම සහ එහි  දිගුකාලීන ඉතිහාසය හා එමගින් ශ්‍රී ලංකාවේ සිදුකර තිබෙන කාර්යයභාරය සිහිපත් කළේය.  ඉංග්‍රීසි ඉගැන්වීම සඳහා මේ ආකාරයෙන්  සහයෝගය දැක්වීම සියලු ශ්‍රී ලාංකිකයින් සඳහා නොයෙකුත් ඉඩප්‍රස්ථාවන් සඳහා දොරටු විවෘත කිරීමක් බව ඔහු ප්‍රකාශ කළේය.

මේ අවස්ථාවට අධ්‍යාපන ක්ෂේත්‍රයේ නායකයින්, රාජ්‍ය නිලධාරීන් සහ ප්‍රජා සාමාජිකයින් සහභාගී විය. ඇමරිකානු ස්වේච්ඡා සාම ප්‍රජාවේ විසි පස් දෙනෙකුගෙන් යුත් ප්‍රථම කණ්ඩායම 2019 වසර අග භාගයේදී ශ්‍රී ලංකාවට පැමිණේ. මාස තුනක කාලයක් සංස්කෘතික, භාෂාමය සහ තාක්ෂණික කරුණු පිළිබඳ පූර්ණ පුහුණුවකින් පසුව  වසර දෙකක සේවා කාලයක්  ඔවුන් ශ්‍රී ලංකාවේ සේවය කරනු ඇත.

ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි ගුරුවරුන්ගේ සංගමය සමග සහයෝගය ඇතිව අධ්‍යාපන අමාත්‍යංශය, පාසල් සහ ප්‍රජා කණ්ඩායම් සඳහා ඉංග්‍රීසි අධ්‍යාපනය ලබාදීමට ඔවුන් ශ්‍රී ලංකාවේදී  ප්‍රයත්න දරනු ඇත.  එක්සත්

ජනපද තානාපති කාර්යාලයේ සහ අන්තර්ජාතික සංවර්ධනය සඳහා වන එක්සත් ජනපද නියෝජිතායතනය අරමුදල් සපයනු ලබන අනෙකුත් ඉංග්‍රීසි ඉගැන්වීමේ වැඩ සටහන්වලට ඔවුන් දායකත්වය ලබාදෙනු ඇත.

2016 දී සාම බලකා කණ්ඩායම්වලට නැවතත් ලංකාවට පැමිණෙන ලෙසත් රටෙහි සංවර්ධන ඉලක්කයන්ට ළඟාවීමට අවශ්‍ය සහාය ලබාදෙන ලෙසත් රජය විසින් ඉල්ලා සිටින ලදී. මෙම වැඩසටහන යළි ස්ථාපිත කිරීම සඳහා නව ද්විපාර්ශවික ගිවිසුම 2018 පෙබරවාරි මස අත්සන් කෙරිණි.

Peace Corps - විවිධ වූ රටවල ප්‍රජාවන් සමග වැඩකරමින් ස්ථිරසාර වෙනස්කම ඇතිකිරීම සඳහා සේවය කිරීමට සාම ප්‍රජා වැඩසටහන යටතේ ඇමරිකානු ජාතිකයින් සහභාගී කරවීම මෙහිදී සිදුවේ. මෙහිදී එම ස්වේච්ඡා සේවකයින් අධ්‍යාපනය, සෞඛ්‍යය, ප්‍රජා ආර්ථික සංවර්ධනය යනාදී ක්ෂේත්‍රයන් හි අභියෝග ජයගැනීම සඳහා ස්ථිරසාර විසඳුම් ලබාදීමට ක්‍රියාකරනු ලබයි. සාම බලකා අත්දැකීම් තුළින් ස්වේච්ඡා සේවකයින්ට විවිධවූ සංස්කෘතීන් පිළිබඳ සුවිශේෂී වූ අවබෝධයක් ලබාගැනීමටත් ස්වේච්ඡා සේවය සඳහා යාවජීව කැපවීම් සිදුකිරීම තුළින් වර්තමාන ලෝකයේ ආර්ථික සාර්ථකත්වය ලබාගැනීමටත් ඔවුන්ට හැකිවේ. ජනාධිපති ජෝන් එෆ් කෙනඩි 1961 වසරේදී පීස්කෝප්ස් ස්ථාපිත කිරීමෙන් පසු සියලු වයස් කාණ්ඩ වලට අයත් ඇමෙරිකානු ජාතිකයින් 230000 කට වැඩි පිරිසක් ලෝකය පුරා රටවල් 141 ක සේවය කර තිබේ.

වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර peacecorps.gov Facebook Twitter. වෙත පිවිසෙන්න